# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1994 අංක 18 දරන
# ඇල්පිටිය විහාරමහාදේවි පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1994 ජූනි මස 23 වැනි දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1994 ජූනි මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.**

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී**

**කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.**

මිල : ශත 75 යි. තැපැල් ගාස්තුව : රු. 1·00 යි.

## 1994 අංක 18 දරන ඇල්පිටිය විහාරමහාදේවී පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1994 ජූනි මස 23 වන දින.]

**එල්. ඩී.—ඕ. 34/92**

**ඇල්පිටිය විහාරමහාදේවී පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

"ඇල්පිටිය විහාරමහාදේවී පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සභාවක් එකී සභාවේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී සභාවට සම්බන්ධ සියලුම කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කර ගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ඇල්පිටිය විහාරමහාදේවී පිරිවෙනේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී සභාව පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සභාව විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කරගෙන ගොස් ඇති හෙයින් සහ ඒ සභාව සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීමට ඉඩදීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මෙම පනත 1994 අංක 18 දරන ඇල්පිටිය විහාරමහාදේවී පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ඇල්පිටිය විහාරමහාදේවී පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව සංස්ථාගත කිරීම.

2. මෙහි මින්මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන ඇල්පිටිය විහාරමහාදේවී පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාවේ දැනට සිටින තාක් සාමාජිකයන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සභාවට මින්මතු ඇතුළත් කරගනු ලබන සාමාජිකයන් "ඇල්පිටිය විහාරමහාදේවී පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව" යන නාමය සහ අභිධානය යටතේ (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන අතර එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකිය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ඇල්පිටිය විහාරමහාදේවී පිරිවෙනේ ගොඩනැගිලි නඩත්තු කිරීම සහ අවශ්‍ය පරිදි සහ අවශ්‍ය වන විට අලුත් ගොඩනැගිලි ඉදි කිරීම සහ නඩත්තු කිරීම;

(ආ) බෞද්ධයන් අතර ආගමික භක්තිය නංවාලීම සඳහා කට යුතු කිරීම;

(ඇ) ඇල්පිටිය විහාරමහාදේවී පිරිවෙනට අනුබද්ධ වෙනත් විහාරස්ථාන සහ පිරිවෙන් නඩත්තු කිරීම:

(ඇ) අධ්‍යාපනික දියුණුව නංවාලීම සඳහා සහ බුදුන් වහන්සේගේ ඉගැන්වීම් ප්‍රචාරය කිරීම සඳහා පිරිවෙන් ඇතුළුව අධ්‍යාපනික ආයතන පිහිටුවීම සහ පවත්වාගෙන යාම;

(ඈ) ධර්ම ඥානය ලබා දීම සහ බෞද්ධයන් විසින් දාන, සීල, භාවනා ප්‍රගුණ කිරීම ප්‍රවර්ධනය කිරීම;

(ඉ) රැකියා ලබා ගැනීමට හෝ ස්වයං රැකියාවල නිරතවීමට තරුණ තරුණියන් පුහුණු කිරීම;

(ඊ) ප්‍රඥාව හා කරුණාව පදනම් කොටගෙන බෞද්ධ පිළිවෙතට අනුව මානසික සුවය, පෞෂත්වය වර්ධනය කර ගැනීම, ජාතික සමගිය සහ ලෝක සාමය ඇති කිරීමට අදාළ වන සම්මන්ත්‍රණ, වැඩමුළු, සම්මේලන සහ දැනුවත් කිරීම් පාඨමාලා පැවැත්වීම;

(උ) පොත් පත්, පර්යේෂණ වාර්තා, වාර සඟරා සහ වෙනත් ලේඛන, ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරක, චිත්‍රපට සහ කැසට් අඩංගු පුස්තකාල පිහිටුවීම;

(ඌ) අසරණයන්ට පිහිටවීම;

(එ) ළමා, තරුණ, මහලු සියලු දෙනාට සදාචාරාත්මක මාර්ගෝපදේශකත්වය ලබාදීම සහ තම අවශ්‍යතා ඉටු කර ගැනීමට ශිෂ්‍යයන්ට ආධාර කිරීම;

(ඒ) නිසි සුදුසුකම් සහ ආගමික භක්තිය ඇති තරුණයන් පැවිදි කිරීම සහ ඔවුන්ට සිවුපසය සැපයීම;

(ඔ) යෝගාශ්‍රම සහ ආරණ්‍ය සේනාසන පිහිටුවීම සහ භාවනා කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම;

(ක) ආබාධිතයන් සඳහා සුභ සාධක පහසුකම් සැලසීම;

(ග) සියලු ප්‍රජා කොට්ඨාස අතර ආගමික, ජාතික සහ සමාජ සහයෝගතාව ප්‍රවර්ධනය කිරීම;

(ච) ශ්‍රී ලංකාවේ සහ ඉන් පිටත පිහිටි වෙනත් බෞද්ධාගමික සංවිධාන සමඟ සුහද සම්බන්ධතා පවත්වාගෙන යාම;

(ජ) තරුණ තරුණියන්ට රැකියා ලබාදීම සඳහා අවශ්‍ය වන මූලික දක්ෂතා ලබාදීම;

(ට) රෝගී භික්ෂූන් සඳහා ආරෝග්‍යශාලාවක් පිහිටුවීම සහ ආශ්‍රමවාසී භික්ෂූන්ට අවශ්‍ය වෛද්‍ය පහසුකම් සැපයීම;

(ඩ) සාමය අරමුණු කොට ගත් අධ්‍යයන කණ්ඩායම්, භාවනා කණ්ඩායම්, ජනසංනිවේදන කණ්ඩායම් සහ ක්‍රියාකාරී කණ්ඩායම් සඳහා ලේඛන මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියා කිරීම සහ තොරතුරු හුවමාරු කර ගැනීම සහ අත් දැකීම් බෙදා හදා ගැනීම සඳහා පහසුකම් සැලසීම;

(ණ) වර්තමාන සමාජයට ගැලපෙන අධ්‍යාපනික න්‍යායයක් බිහි කිරීම අරමුණු කොටගෙන ආගමික දර්ශනය සහ බෞද්ධ අධ්‍යාපනික දර්ශන හා වෙනත් නවීන අධ්‍යාපනික දර්ශන තුලනාත්මකව අධ්‍යයනය කිරීම ;

(ත) ලෝක සාමය ඇති කිරීම සඳහා ලෝක බෞද්ධ සම්මේලනය සහ රාජ්‍ය සංවිධාන හෝ රාජ්‍ය නොවන සංවිධාන වන වෙනත් ආගමික සහ ශිෂ්‍ය අන්තර් ජාතික සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම ; සහ

(ද) ඉහත සඳහන් පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය වන, හිතකර වන හෝ ආනුෂංගික වන වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට යටත්ව, සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබාගැනීමේ ද ප්‍රදානයන් හා පරිත්‍යාගයන් භාරගැනීමේ හා එකතු කිරීමේ ද ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කර ගැනීමේ, සේවයෙහි යෙදවීමේ සහ සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර ආකාරයක හෝ සියලු ක්‍රියා කිරීමේ, කාරණා ඉටු කිරීමේ හා දේවල් ක්‍රියාවේ යෙදවීමේ බලය සංස්ථාවට ඇත්තේ ය. සංස්ථාවේ සාමාන්‍ය බලතල.

5. (1) සංස්ථාවේ කටයුතු, ගරු අධ්‍යක්ෂ ජනරාල්, උප සභාපතිවරු, ගරු ලේකම්, උප ලේකම්, ගරු භාණ්ඩාගාරික සහ මේ රීති වලින් විධිවිධාන සලස්වා ඇත්තා වූ ද මේ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන්නා වූ ද හය දෙනකුට නොඅඩු වෙනත් සාමාජිකයන් සංඛ්‍යාවකගෙන් ද සමන්විත වූ කළමනාකාර කමිටුවක් විසින්, සංස්ථාවේ රීතිවලට යටත්ව කළමනාකරණය කරනු ලැබිය යුතුය. සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ පටහැනිව කුමක් සඳහන්ව ඇතද ඇල්පිටිය විහාරමහාදේවි විහාරස්ථානයේ විහාරාධිපති වැලිවිටියේ සීවලී හිමි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් විය යුතු අතර උන්වහන්සේ කලින් ඉල්ලා අස්වුවහොත් මිස, සංස්ථාවේ යාවජීව අධ්‍යක්ෂ ජනරාල් විය යුතුය. උන්වහන්සේගෙන් පසු අධ්‍යක්ෂ ජනරාල් ධූරයට උන්වහන්සේගේ අනුප්‍රාප්තිකයා උන්වහන්සේ විසින් නම් කරනු ලැබිය යුතු ය. එසේ අනුප්‍රාප්ත වන අධ්‍යක්ෂ ජනරාල්වරයා ද කලින් ඉල්ලා අස්වුවහොත් මිස, යාවජීව අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් වන්නේය.

(3) සංස්ථාවේ ප්‍රථම කළමනාකාර කමිටුව, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට ඉහතින්ම වූ දිනයේ දී සභාවේ කළමනාකාර කමිටුවේ සාමාජිකත්වය දැරුවා වූ ද මේ පනතේ උපලේඛනයේ නම් සඳහන් කොට ඇත්තා වූ ද, තැනැත්තන් ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් පහත සඳහන් කාරණා සියල්ලම හෝ ඉන් කිසිවක් සඳහා, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට අනනුකූල නොවන රීති සංස්ථාව විසින් කලින් කල සාදනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය :—

(අ) සාමාජිකයන් වර්ග කිරීම සහ ඔවුන් ඇතුලත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම ;

(ආ) ධූර දරන්නන් තෝරා පත්කර ගැනීම, ධූර දරන්නන් ඉල්ලා අස්වීම හෝ ධූරය හිස් කිරීම හෝ ධූරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, චර්යාව සහ කාර්ය ;

(ඇ) කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ බලතල, චර්යාව සහ කාර්ය ;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය;

(ඉ) සංස්ථාවේ සහ කළමනාකරණ කමිටුවේ රැස්වීම්වලදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ඒ රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, ඒ රැස්වීම් පැවැත්වෙන වේලාවන්, ස්ථාන, ඒ රැස්වීම් පිළිබඳ දන්වීම් සහ න්‍යාය පත්‍ර, රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වලදී සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වාගෙන යාම සහ විගණනය කිරීම ; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ ඒ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් (1) වන උප වගන්තිය යටතේ රීතියක් සාදන අන්දමට එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට ඉහතින් ම දිනයේදී පැවති සභාවේ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සියලුම සාමාජිකයන් සංස්ථාවේ තත්කාලයේ බල පවත්නා රීතිවලට යටත් විය යුතු ය.

**7.** මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට ඉහතින්ම වූ දිනයේ දී පැවති සභාවේ සියලුම ණය සහ බැර කම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර එදිනට සභාවට අයවිය යුතු සියලු ණය හෝ ගෙවිය යුතු දායක මුදල් හෝ සම්මාදම් මුදල් මෙම පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

සභාව විසින් ගෙවිය යුතු සහ සභාවට අයවිය යුතු ණය.

**8.** සංස්ථාවේ මුද්‍රාව ලේකම්වරයා භාරයේ තිබිය යුතු අතර කළමනාකරණ කමිටුව විසින් තීරණය කරනු ලබන ආකාරයකට එය වෙනස් කරනු ලැබිය හැකි ය. කළමනාකරණ කමිටුවේ අනුමැතිය ඇතිව සහ කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් දෙදෙනා විසින් එම සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සනට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**9.** යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමකින් හෝ අන්‍යාකාරයකින් සංස්ථාව වෙත සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් භාරගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙන් බලය සහ හැකියාව ඇත්තේ ය. තව ද එවැනි සියලුම දේපළ මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවේ රීතිවලට යටත්ව ඒ දේපළ උකස් කිරීමේ, විකිණීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**10.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් වෙතින්, ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනයම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**11.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

## උපලේඛනය

[5 (3) වගන්තිය]

අධ්‍යක්ෂ ජනරාල් : ඇල්පිටිය විහාරමහාදේවි විහාරාධිපති වැලිවිටියේ සීවලී හිමි.

උපසභාපතිවරු : (1) පී. කේ. ධර්මසේන මහතා.

(2) එඩ්මන් කාරියවසම් මහතා.

ලේකම් : සුමිත්‍රපාල කාරියවසම් මහතා.

උප ලේකම් : එන්. කේ. චන්ද්‍රදාස මහතා.

භාණ්ඩාගාරික : වෛද්‍ය කේ. බී. වංශපාල මහතා

සෙසු සාමාජිකයින් :

(1) ඒ. පී. සෝමපාල මහතා.

(2) ඊ. පී. ගුණවර්ධන මහතා.

(3) සලමන් ගමගේ මහතා.

(4) කේ. ඇසා මහතා.

(5) ඒ. කේ. සිරිසේන මහතා.

(6) ආනන්ද ජයදේව මහතා.

(7) ශ්‍රියානන්ද කාරියවසම් මහතා.

(8) එම්. ජී. මහතුන් මුදලාලි මහතා.

(9) ඩී. කේ. ආරියවතී මහත්මිය.

(10) බී. ජී. ඊ. කාරියවසම් මහත්මිය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මුදල (දේශීය) රු. 370 කි. විදේශීය රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව මුද්‍රිත එන් එන් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.